# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


2013/01/07

## මාධ්‍ය නිවේදනයයි

### ස්ථාන මාරු ලැබූ වෛද්‍යවරුන්ගේ දරුවන්ට පාසල් ලබා දීම

වෛද්‍යවරුන් අවුරුදු 04කට වරක් ස්ථාන මාරු ලබන එකම රාජ්‍ය නිලධාරීන් කොට්ඨාශයයි. මෙසේ ස්ථාන මාරු ලැබීම නිසා ගෞරවනිය සේවයක් ලබාදීම සහතික වේ. තවද දිපව්‍යාප්ත සේවාවක් වන ශ්‍රී ලංකා වෛද්‍ය සේවය මුළු රට පුරාම ඒකාකාරීව ලබාදීම මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම තුලින් ක්‍රමානුකූලව සිදුවේ.

මෙසේ ස්ථාන මාරු ලැබූ වෛද්‍යවරුන්ගේ දරුවන්ට නව සේවා ස්ථානයට ආසන්නයේ ජාතික පාසලක් ලබා ගැනීම සඳහා  අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත්, ගරු අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මැතිතුමාත් ගරු සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ  ඉල්ලීම අනුව කටයුතු කෙරුණි. මේ අනුව 01 ශ්‍රේණියටත්  ඉන් ඉහල ශ්‍රේණි සඳහාත්  වෛද්‍යවරුන්ගේ දරුවන්ට පාසල් ලබාදීම පසුගිය  වසරවලදී  සාර්ථකව සිදුවිය.

ඉදිරියටත් මෙසේ  රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මැදිහත්වීම හරහා ස්ථාන මාරු ලැබූ වෛද්‍යවරුන්ගේ දරුවන්ට  පාසල් ලබාදීම සිදුවිය  යුතු බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය අවධාරනය කරයි.

මෙසේ රජයේ මැදිහත්වීම සහිතව වෛද්‍යවරුන්ගේ දරුවන්ට පාසල් ලබාදීමට හැකිවීම නිසා වෛද්‍ය සේවා ලබා දීමට බාදාවක් නොවන පරිදි රජයේ වෛද්‍යවරුන්ගේ දරුවන්ට ජාතික පාසල් ලබා දීමට හැකි විය. ඉදිරියටත් මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයත්,  අධ්‍යාපන අමාත්‍යාංශයත්, රජයත්  අවශ්‍ය සහයෝගය ලබා දීමෙන් සෞඛ්‍ය සේවාවන් ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සහ ජනතාව සෞඛ්‍ය අනතුරු වලින් රැක ගැනීමේ මෙහෙයුම අගය කිරීමක් වන බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විශ්වාස කරයි.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

| | | | |
|---|---|---|---|
| වැඩිදුර විස්තර : | වෛද්‍ය නවීන් ද සොයිසා | : | 0718582444 |
| | වෛද්‍ය නාත් විජේසූරිය | : | 0714428322 |
| | වෛද්‍ය නලින්ද හේරත් | : | 0717876516 |